# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1994/69 - 2016 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2016.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : NIDS/LND/5/ACQ/68.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2011/WS/292.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නිවිතිගල සුළු කොට්ඨාසයේ, නිවිතිගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2016.08.16 දිනැතිව මැන සකස් කරන ලද, කැඩැස්තර සිතියම් අංක 620400 කලාප අංක 07න් 05 වැනි කලාපය හා පත්‍ර අංක 4 දරන පිඹුරේ, කැබලි අංක 97 වශයෙන් දැක්වෙන “පිංකන්ද වත්ත“ නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1000ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**කැබලි අංක 97 -** ඉඩමේ නම: පිංකන්ද වත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: 1. සීමාසහිත අගලවත්ත වැවිලි සමාගම, අංක 10, ඥාණාර්ථ ප්‍රදීප මාවත, කොළඹ 8; ප්‍රමාණය: හෙක්. 0.1000.

*මායිම්* :

*උතුරට* : කැබලි අංක 98; *නැගෙනහිරට* : කැබලි අංක 98; *දකුණට* : කැබලි අංක 98; *බටහිරට* : කැබලි අංක 98.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 ජනවාරි මස 16 වැනි දින පෙ. ව. 9.30 ට නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2017 ජනවාරි මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

එම්. එස්. අවන්ති සේනාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නිවිතිගල.

2016 නොවැම්බර් මස 21 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 469

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24644 – 42 (2016/11)

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BD/BW/LND/6/AQUIS/09.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2005/HW/534.

අංක 1981/98 දරන 2016.08.27 දිනැති *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ හි භාෂා ත්‍රිත්වයේම ප්‍රාදේශීය ලේකම්ගේ නම පී. පී. එන්. ගුණරත්න ලෙස සඳහන් කර ඇති අතර එය ජී. ජී. එන්. ගුණරත්න ලෙස සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

තවද 3ජ් පිටුවේ සඳහන් 2016 ඔක්තෝබර් මස 06 වෙනුවට 2016 නොවැම්බර් මස 17 යනුවෙන් හා 2016 සැප්තැම්බර් 29 වෙනුවට 2016 දෙසැම්බර් මස 27 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජී. ජී. එන්. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල.

2016 නොවැම්බර් මස 21 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 470

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.